**තංගල්ල ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 09 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය ව්‍යාචනය**
**-----------------**

මෙම වාර්තාවේ **1.3.1,1.3.2 හා 1.3.4** ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම්වල මුළු එකතුව රු. 318,344,331 ක් වූ අතර, වගකීම් හා හිමිකම්වල එකතුව රු. 326,572,933 ක් විය. ඒ අනුව රු. 8,228,602 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

i. සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ පිළිවෙලින් රු. 3,535,925 ක් හා රු. 8,228,603 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

ii. වර්ෂයේ අතිරික්තය රු. 8,210 ක් අඩුවෙන් සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණි.

iii. පොදු ලෙජරයේ ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු (104) වියදම් ගිණුමේ ශේෂය රු. 9,000 ක් අඩුවෙන් සහ සේවා සඳහා ගාස්තු ගිණුමේ ශේෂය රු. 11,000 ක් අඩුවෙන් ආදායම් වියදම් ගිණුමට සටහන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබූ හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පිරිවැය රු. 803,021 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවිකිරීම් සහ හුම්මාන මධ්‍යස්ථානයේ ඉදි කිරීම් කටයුතු සඳහා දරන ලද රු. 1,694,176 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) මහවෙලගොඩ වෙල්යාය සඳහා පිවිසුම් මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා වූ ණයහිමි ශේෂය රු. 999,410 ක් වැඩියෙන් ද, සමාලෝචිත වර්ෂයේ වියදම් ණයහිමි ශේෂය රු. 101,121 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද රු. 172,271 ක වියදම්, පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉදිරි වර්ෂයට කරන ලද රු. 50,000 ක ඇප තැන්පත්, සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා තංගල්ල ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් සහ 2017 වර්ෂයේ අවසන් මාස හත සඳහා හම්බන්තොට ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 04 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 11,770,804 ක් විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණයහිමියන් සහ කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් රු. 8,347,092 ක් ගෙවිය යුතුව පැවතුණු අතර, වර්ෂ 1 – 2 දක්වා කාල පරාසයකට අයත් ණයහිමියන් තිදෙනෙකු වෙනුවෙන් රු. 387,800 ක් ගෙවිය යුතුව පැවතුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 204,166,909 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම (රු) | අනුකූල නොවීම. |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | |
| i. රීති 5(8) | | සභා පරිශ්‍රයෙන් පිටත ස්ථානයක ගල්රෝල රඳවා තැබීමට කටයුතු කළ අවස්ථාවේදී එය අනතුරට ලක්වී තිබුණි. |
| ii. රීති 150 | | සමාලෝචිත වර්ෂය සඳහා සාරාංශ මුදල් පොත පිළියෙළ කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103(1)(ආ), 104(1), 104(3), 104(4) සහ 110 | 1,510,250 | වයිබ්‍රේටිං ගල් රෝලට සිදු වූ අනතුර සහ හුම්මාන පරිසර මධ්‍යස්ථානයේ ටිකට්පත් විනාශ වීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| i. 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන චක්‍රලේඛය | | නිලධාරියකුට ලබාදිය හැකි උපරිම ණය ශේෂය ඉක්මවා සභාවේ නිලධාරිනියන් දෙදෙනෙකු හට ආපදා ණය ලබාදී තිබුණි. |
| ii. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | | 2017 ඔක්තෝබර් 31 දින වන විටත් සභාව සතු වාහන 11 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | සභාව සතු පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,778,674 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 26,344,124 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

**---------------**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 155 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන මුදල් පොත පිළියෙල කර නොතිබූ හෙයින්, බැංකු ජංගම ගිණුම් 08 ක එකතුව වූ රු. 13,635,329 ක ශේෂයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 8,095,500 | 6,219,053 | 6,310,576 | 275,361 | 11,115,000 | 6,816,354 | 6,815,386 | 142,284 |
| ii කුලී | 11,967,900 | 8,865,155 | 9,416,195 | 1,461,184 | 13,348,000 | 5,457,478 | 5,319,704 | 2,175,964 |
| iii බලපත්‍ර ගාස්තු | 2,446,700 | 4,097,079 | 4,097,079 | - | 3,561,000 | 2,167,301 | 2,199,161 | - |
| iv වෙනත් ආදායම් | 19,554,500 | 16,055,937 | 13,514,765 | 75,187,020 | 34,643,000 | 34,299,461 | 48,955,964 | 72,466,733 |
| එකතුව | 42,064,600 | 35,237,224 | 33,338,615 | 76,923,565 | 62,667,000 | 48,740,594 | 63,290,215 | 74,784,981 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ මුළු ආදායම රු. 35,237,224 ක් වූ අතර, වර්ෂය තුළදී හිඟ ආදායම් ඇතුළුව රු. 33,338,615 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයේදී රු. 74,784,981 ක් ව පැවති මුළු හිඟය සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 76,923,565 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.3.3. වරිපනම් හා බදු**

----------------

(අ) වරිපනම්

-----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු තක්සේරු කර අය කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

(ආ) අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 150,471 ක හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.4 කුලී**

-----

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පැවති රු. 1,443,524 ක් වූ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.5 වෙනත් ආදායම්**

-----------------

ව්‍යාපාර බදු

--------------

සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ව්‍යාපාර බදුවල එකතුව රු. 124,890 ක් වූ අතර, ඉන් රු. 40,950 ක් 2014 වර්ෂයට අදාළ හිඟ ශේෂයක් විය.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

දකුණු පළාත් සභාවෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට උසාවි දඩ රු. 4,691,736 ක් හා මුද්දර ගාස්තු රු. 70,369,719 ක් ලැබිය යුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධනය**

---------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

i. සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, භෞතික හා මූල්‍ය කාර්ය සාධනය හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කර නොතිබුණි.

ii. බල ප්‍රදේශය හඳුනාගැනීමේ හා පිවිසුම් පුවරු සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් රු. 1,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එය ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

---------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යන් 11 ක් සඳහා අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ඉටු නොකළ කර්තව්‍යන්

---------------------------

සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට අයවැය ලේඛනය මගින් එකතුව රු. 2,160,000 ක ප්‍රතිපාදන සලසා තිබූ කාර්යයන් 05 ක් සහ ප්‍රාග්ධන ආධාර මගින් ක්‍රියාත්මක කිරීමට එකතුව රු. 6,100,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ කර්තව්‍යයන් 04 ක් වර්ෂය තුළදී ඉටු කර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

i. කසළ බැහැර කරන භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණි.

ii. විශාල වියදමක් දරා ප්‍රදේශයේ ජනනය වන කසළ රැස් කර තිබුණද, රැස් කරන කසළ භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම, ආරම්භ කර නොතිබුණි.

iii. ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා පාරිසරික නිර්දේශ ලබා ගැනීමට 2018 මැයි 25 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

### 3.2.1 වීථි පහන් නඩත්තුව

---------------------

2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති වීථි පහන් සංඛ්‍යාව, ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් අනුමත කර ගැනීමට කටයුතු නොකිරීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 2345 න් 2028 ක් සඳහා ගාස්තු ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

### 3.2.2 තොරතුරු කළමනාකරණ පද්ධතියක් මිලට ගැනීම

-----------------------------------------------------

ගබඩා තොග, රථ වාහන තොරතුරු, දෛනික තැපැල හා විවිධ ආදායම් කළමනාකරණ පද්ධති මිලට ගැනීම සඳහා 2016 වර්ෂයේදී ගෙවා තිබුණු රු. 229,250 ක අත්තිකාරම් මුදලින් රු. 145,000 ක් වූ දෛනික තැපැල කළමනාකරණ පද්ධතිය පමණක් ලබා ගෙන තිබූ අතර, සේවාව ලබා නොගත් කාර්යයන් සඳහා ගෙවන ලද රු. 84,250 ක වටිනාකම ආපසු අයකර ගැනීමට 2018 අප්‍රේල් 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 24 කට අදාළව 53 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 04 කට අදාළව 08 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ආ) සභාවේ සේවය කරන නිලධාරීන් 07 දෙනෙකු ඔවුන්ගේ නියමිත තනතුරු වලට අදාළ රාජකාරීවල නොයොදවා වෙනත් රාජකාරී කටයුතු වල යොදාවා තිබුණි.

(ඇ) මෝටර් ග්‍රේඩරය ක්‍රියාකරවීම මත දිනකට පැය 04 ක් ඉක්මවා වැඩ කළ මුළු කාලය සඳහාම පැයකට රියැදුරුට රු. 50 ක් හා රිය සහායකට රු. 40 ක් වශයෙන් රු. 85,520 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

----------------------------

### 3.4.1 පවරා නොගත් වත්කම්

-------------------------

ප්‍රාදේශීය සභාව විසින් භාවිතයට ගනු ලබන ඉඩම් හා ගොඩනැගිලි 51 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය වත්කම්**

**-------------------**

2005 වර්ෂයේ සිට නිෂ්ක්‍රීය තත්ත්වයෙන් සභා පරිශ්‍රය තුළ තිබෙන කැබ් රථයක් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.4.3 වාහන උපයෝජනය**

**----------------------**

(අ) වාහනවල අයිතිය පවරා නොගැනීම

---------------------------------------

විවිධ ආයතන වලින් සභාවට ලැබී තිබුණු වාහන 06 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2017 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) වාහන අනතුරු

-----------------

වයිබ්‍රේටිං ගල් රෝලටට සිදු වූ අනතුරෙහි හානි පූර්ණය සඳහා රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය නොකළ රු. 24,037 ක මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

(අ) ප්‍රාදේශීය සභා අරමුදලින් 2016 හා 2017 වර්ෂවල ඉදිකළ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරූ මාර්ග 11 ක 2017 දෙසැම්බර් 09 දින තත්ත්ව පරීක්ෂාවට ඉදිරිපත් කළ කුට්ටිගල් 150 න් 136 ක් ම නියමිත ප්‍රමිතියෙන් තොර බව තත්ත්ව පරීක්ෂණාගාර ප්‍රතිඵල අනුව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම මාර්ග ඉදි කිරීම් සඳහා ගෙවන ලද රු. 8,396,237 ක මුදල ඵලදායි නොවන ගෙවීමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) ඉටුනොකළ වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීම

-----------------------------------------------

මාර්ග හතක ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී සත්‍ය ඉදිකිරීම් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට රු. 429,515 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය හා පරිපාලන) 101 ට අනුව මුදල් වැය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු වුවත්, මාර්ග 5 ක් ඉදිකිරීම් වෙනුවෙන් රු. 3,683,552 ක් ගෙවීම් කිරීමේදී මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) විවිධ වියදම් විෂයයන් 35 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 1,185,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම වර්ෂය අවසානයට ඉතිරිව පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් හතක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 125,585,825 ක් වූ අතර, එම වටිනාකම් සියයට 11 සිට සියයට 97 ක් දක්වා පරාසයක විය.

(ඇ) වැය විෂයයන් 06 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 13,618,542 ක් වූ අතර, එම වටිනාකම් සියයට 10 සිට සියයට 63 දක්වා පරාසයක විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් ශේෂ අත්හැරීම්, අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කර ඇති අවස්ථා පැවතීම. |
| | ii. ගිණුම් තුළනය කිරීමේ දෝෂයන් පැවතීම. |
| | iii. සාරාංශ මුදල් පොත හා ප්‍රධාන මුදල් පොත පිළියෙල කර නොතිබීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. නව වරිපනම් බදු පනවා අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | ii. හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | iii. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| (ඇ) වාහන පාලනය | i. වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |
| | ii. වාහනවල අයිතිය පවරා නොගැනීම. |

| | | |
|---|---|---|
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | i. | ඇස්තමේන්තු සකස් කිරීමේදී වැඩ විස්තරය පැහැදිලිව නොදැක්වීම හා මිල ගණන් උපුටාගත් මූලාශ්‍රය දක්වා නොතිබීම. |
| | ii. | කර්මාන්ත ඉටු කිරීමේදී ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර නොතිබීම. |
| | iii. | ඉටු නොකළ වැඩ වෙනුවෙන් ගෙවීම් කර තිබීම. |
| (ඉ) අයවැය පාලනය | i. | අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විෂයයන් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| | ii. | අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු නොකිරීම. |